# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,851 — 1969 අප්‍රේල් 25 වැනි සිකුරාදා — 1969.4.25**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 633 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 642 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 643 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | 655 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 655 | කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 657 |
| මධු බාහිරාදිය විකිණීම ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසි වලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙසු සැමට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

## විශෙෂ නිවේදනයයි

1969 අප්‍රේල් මස 30 වෙනිදා රජයේ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශකර ඇති හෙයින් එම සතියේ ගැසට් පත්‍රය අප්‍රේල් 29 වෙනි දින පලකරනු ඇත.

එම ගැසට් පත්‍රයට ඇතුලත් කලයුතු සියළුම නිවේදන, ගැසට් පත්‍රයේ සාමාන්‍යයෙන් පලවන දැන්වීමේ උපලේඛනයේ දැක්වෙන ප්‍රකාර 69.4.23 වෙනි දින දවල් 12 ට පෙර නොව, 69.4.22 වෙනි දින සවස 3.30 ට පෙර ආණ්ඩුවේ මුද්‍රණාලය වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැ. බ. ආ. මුද්‍රණාලයාධිපති.

අණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ, 69.4.10 දින.

අධ්‍යාපන නීතිය පිළිබඳ ප්‍රශ්න පත්‍රයක් ද, මුදල් රෙගුලාසි පිළිබඳ ප්‍රශ්න පත්‍රයක් දැයි ප්‍රශ්න පත්‍ර තුනකින් යුතු රාජ්‍ය ව්‍යවස්ථා හා රෙගුලාසි පිළිබඳ විභාගයකින් සාමාර්ථය ලැබිය යුතුය. මෙම විභාගයෙන් සාමාර්ථය ලැබුමට ඉඩදී ඇති කාල සීමාවට වැඩි කාලයක් ගතවී සාමාර්ථය ලැබූ විට එසේ ගත වූ වැඩි කාල පරිච්ඡේදය පඩි වැඩිවීම නතර කළ කාල පරිච්ඡේදයක් ලෙස සලකනු ඇත.

(iv) තෝරාගනු ලැබූ අයදුම්කරු, පත්වීම ලැබූ දින සිට සතර අවුරුදු කාල සීමාවක් ඇතුළත දී සාමාන්‍ය ලිපිකාර සේවාවේ විධායක ලිපිකරු පන්තියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නියමිත සිංහල/දෙමළ ජාතික භාෂා විභාගයේදී තමාට උචිත පරිදි සිංහල/දෙමළ භාෂාවෙන් සාමාර්ථය ලැබිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත්, වැටුප් වැඩිවීම් විලම්බනය කිරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. මෙම විභාගයෙන් සාමාර්ථය ලැබීමට ඉඩදී ඇති කාල සීමාවට වැඩි කාලයක් ගතවී සාමාර්ථය ලැබූ විට එසේ ගත වූ වැඩි කාල පරිච්ඡේදය පඩි වැඩිවීම විලම්බනය කළ කාල පරිච්ඡේදයක් ලෙස සලකනු ඇත.

3. **වැටුප් සහ දීමනා.**—රු. 5,520 ක වාර්ෂික වැටුපකින් පටන්ගෙන රු. 360 ක වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් ද, රු. 480 ක වාර්ෂික වැටුප් වැඩිවීම් 2 කින් ද, වාර්ෂික වැටුප රු. 7,320 ට පෙරාතුව කාර්යක්ෂමතා කඩඉමකින් ද යුක්තව වාර්ෂික වැටුප රු. 9,360 දක්වා නගින වැටුප් ක්‍රමය මෙම තනතුරට අයත් ය.

**අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(ආ) 1969 මැයි මස 10 වෙනි දිනට වයස අවුරුදු 30 නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපායි ;

(ඇ) ශාරීරික අධ්‍යාපනය පිළිබඳ යටත් පිරිසෙයින් තුන් වර්ෂයක ඉගැන්වීමේ පළපුරුද්දක් සමග ශාරීරික අධ්‍යාපන පිළිබඳ පිළිගත් විද්‍යාලයක හෝ ආයතනයක එක් වර්ෂයක පශ්චාත් උපාධි නේවාසික පාඨමාලාවක් හැදෑරීමෙන් පසු පිරිනමන ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම ; හෝ

ශාරීරික අධ්‍යාපනය පිළිබඳ යටත් පිරිසෙයින් පස් වර්ෂයක ඉගැන්වීමේ පළපුරුද්දක් සමග ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පිළිගත් විද්‍යාලයක හෝ ආයතනයක දෙවර්ෂයක නේවාසික පාඨමාලාවක් හැදෑරීමෙන් පසු පිරිනමන ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම ; හෝ

ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පිළිගත් විද්‍යාලයක හෝ ආයතනයක එක් වර්ෂයක නේවාසික පාඨමාලාවක් හැදෑරීමෙන් පසු ශාරීරික අධ්‍යාපන පරීක්ෂක/පරීක්ෂිකාවක් වශයෙන් යටත් පිරිසෙයින් දස වර්ෂයක සතුටුදායක සේවා කාලයක් තිබීම ; හෝ

(ඈ) ඉහත සඳහන් කිනම් අතුරු ඡේදයක වුවද සඳහන් සුදුසුකම් වලට සමාන හෝ උසස් සුදුසුකම් තිබීම.

සටහන : මලල ක්‍රීඩා හා සංවිධිත ක්‍රීඩාවල විශිෂ්ඨත්වයක් ඇති අය ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් හෝ විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදා දැයි ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සිල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුනට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුනු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අප්‍රේල් මස 18 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය,
තැ. පෙ. 500.

4–837—69.4.25 දින අංක 14,851 දරන ගැසට් පත්‍රය

---

## පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

### පාඨශාලාධිපතිනි තනතුර

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාතර්මේන්තුවේ, ගැහැණු ළමුන්ගේ සහතික කළ පාසලෙහි පාඨශාලාධිපතිනි තනතුර සඳහා අයදුම්පත්‍ර මෙයින් කැඳවනු ලැබේ.

2. අයදුම්පත්‍ර.—

(අ) මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව තම අත් අකුරින්ම පුරවා,

(ආ) පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් තැන, තැ. පෙ. 546, කොළඹ 1 යන ලිපිනයට (පෞද්ගලික නමට නොව),

(ඇ) 1969.5.10 දිනට හෝ ඊට පලමු ලැබෙන ලෙස ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි.

**සැලකිය යුතුයි.**—අයදුම් පත් එවන කවරයේ වම් පැත්තේ මුදුන් කෙලවරෙහි "පාඨශාලාධිපතිනි තනතුර සඳහා අයදුම් පත" යන්න සඳහන් කළ යුතුයි.

3. වැටුප.—රු. 3,660 න් පටන් ගෙන රු. 120 වාර්ෂික වැඩිවීම් 2ක්ද, රු. 180 වාර්ෂික වැඩිවීම් 8 ක්ද, රු. 240 වාර්ෂික වැඩිවීම් 5 ක්ද, ලැබ රු. 6,540 කින් කෙළවර වන වැටුප් ක්‍රමයකි. රු. 5,340 ට පෙර කාර්යක්ෂමතා කඩයිමකි.

4. **පත්වීම පිළිබඳ කොන්දේසි.**—මේ තනතුර ස්ථිරය. විශ්‍රාම බැටුප් හිමිය. තෝරා ගන්නා තැනැත්තියට වැටුපෙන් සියයට 5 ක් රජයේ අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවීමට සිදුවනා අතර, ඇගේ කැමැත්ත පිට තවත් සියයට 5 ක් ගෙවිය හැකිය. කෙසේ වෙතත් රජයේ දායක මුදල සියයට 7½ කි.

5. සේවා කොන්දේසි.—තෝරා ගන්නා අයදුම්කාරිය—

(අ) අවුරුදු තුනක (3) ආධුනික කාලයකට යටත්වේ.

(ආ) දැනටමත් රජයේ සේවයේ නියුතු ස්ථිර නිලධාරිනියක් තෝරා ගනු ලැබුවහොත් එක් අවුරුදු වැඩ බැලීමකට යටත් වේ.

(ඇ) සේවයේ රඳවා ගැනීම සඳහා, විශේෂ පුහුණුවීමේ පාඨ මාලාවක් සම්පූර්ණ කර එය අවසානයේ දී පවත්වනු ලබන විභාගයෙන් සමත් විය යුතුය.

(ඈ) කාර්යක්ෂමතා කඩඉම පසු කරන්නට මත්තෙන් බඳවා ගැනීමේ පරිපාටියේ උපලේඛනයෙහි සඳහන් නියමිත විභාගයන් ගෙන් සමත් විය යුතුය.

(ඉ) ලංකාවේ ඕනෑම තැනක සේවය කිරීමට සූදානම් විය යුතුය.

6. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—සෑම අයදුම්කාරියක්ම පහත සඳහන් කරුණු සඳහා සැලකිය යුතු සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි:—

(i) ලාංකිකයෙක් බවට,

(ii) 1969.5.10 දිනට වයස අවුරුදු 28 ට නොඅඩු හා 50 ට නොවැඩි බවටත්, (රජයේ සේවයේ නියුතු අයට මෙම උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.)

(iii) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහ,

(අ) පිළිගත් ආයතනයක සමාජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකය, හෝ

(ආ) අවුරුදු 5 ක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති, හෝ

(ඇ) සමාන සුදුසුකම් ඇති අය විය යුතුයි.

(iv) විශිෂ්ඨ චරිතයක් හා මනා ශාරීරික සෞඛ්‍යයක් ඇති බවට.

**සැලකිය යුතුයි.**—සමාජ ගෘහ සාධනය පිළිබඳ ශාස්ත්‍රීය සුදුසුකම් හෝ/පළපුරුද්දෙන් ලත් අත්දැකීම් අතිරේක සුදුසුකම් ලෙස සළකනු ඇත.

7. අයදුම්කාරියන් විසින් තම අයදුම් පත්වලට පහත සඳහන් සහතිකවල පිටපත් පමණක් ඇමිණිය යුතුය:—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කරන ලද සහතික පත්‍ර භාරගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිතය පිළිබඳව මෑත දී ලබා ගත් සහතික තුනක්.

8. නියමිත දිනට පසුව ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ. 6 වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් ලත් දැනට රජයේ සේවයේ සිටින අයදුම්කරුවන්ගේ අයදුම් පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය. එම ඉල්ලුම් පත්‍ර නියමිත දිනට පසු මෙම දෙපාර්තමේන්තුවට ලැබුණොත් ඒ ඉල්ලුම් පත්‍ර ඒ ඒ අයදුම්කරුවන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ඒ දිනයට කලින් ලැබුණු බව සඳහන් කර එම ඉල්ලුම් පත්‍ර ප්‍රමාද වීමට සැහෙන හේතූන් දක්වමින් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් එම ඉල්ලුම් පත්‍ර භාරගන්නා ලෙස නිර්දේශයක් කළ හොත් පමණක් එසේ ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

9. ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළකර තිබෙන රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත්වීම සම්බන්ධ පොදු කොන්දේසි බලනු මැනවි.

10. මෙම නිවේදනයට සෑම ආකාරයකින්ම අනුකූල නොවන අයදුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ. අයදුම් පත් ලැබුණු බව දන්වනු නො ලැබේ.

11. අයදුම්කරුවෙකු වෙනුවෙන් මොනයම් ආකාරයක හෝ අනුග්‍රහයක් ලබා ගැනීමට තැත් කළ හොත්, ඒ නයින්ම ඔහු නුසුදුස්සෙකු ලෙස සැලකෙනවා ඇත.

ඩබ්. ආර්. බී. රාජකරුණා,
පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 546, 101 1/1, ද මැල් ගොඩනැගිල්ල,
චැතැම් වීදිය,
කොළඹ 1, 1969.4.18.

## ආදර්ශ අයදුම් පත

### පාඨශාලාධිපතිනි තනතුර

(1) සම්පූර්ණ නම :————.

(2) ස්ථිර ලිපිනය :————.

(3) වයස හා උපන් දිනය :————.
(සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

(4) අයදුම්කාරියගේ පියා උපන් දිනය හා ස්ථානය :————.

(5) විවාහක ද අවිවාහක ද යන වග :————.

(6) (i) සමත් වී ඇති උසස් විභාග :—
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි)

(ii) අධ්‍යාපන ලැබූ පාසල් :————.

(7) සිංහල හා දෙමළ භාෂාව කියවීම, ලිවීම සහ පරිවර්තනය කිරීම පිළිබඳ ඇති නිපුණත්වය :————.

(8) සමාජ සේවය පිළිබඳ ලබා ඇති සුදුසුකම් හා පළපුරුදුකම් :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි)

(9) පාසැලෙන් අස්වීමෙන් පසු කරන ලද රැකියාවන් :————.
(කවුරුන් යටතේ ද, කුමන රැකියාවක් ද, කොපමණ කාලයක් ද යනු සඳහන් කළ යුතුයි. අයදුම්කාරිය රජයේ සේවයෙහි නියුක්තව සිටියේ ද හෝ සිටි ද එසේ නම් ඈ කළ රාජකාරි ගැන විස්තර ද සඳහන් කළ යුතුයි).

(10) දැනට කරන රැකියාව :————.

(11) අමුතා ඇති චරිත සහතික ලබාගත් පුද්ගලයන්ගේ නම් සහ ලිපිනයන් :————.

————,
අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

**සැලකිය යුතුයි :** සහතිකවල පිටපත් මිස, මුල් පිටපත් නොඑවිය යුතුයි. එවන ලද සහතික පත්‍ර ආපසු එවනු නොලැබේ.

4–810—69.4.25 දින අංක 14,851 දරන ගැසට් පත්‍රය

---

සැඳහුම : සාප/3/207

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා පිළිබඳ උපදේශක තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයන්හි යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා පිළිබඳ උපදේශක තනතුරු සඳහා පහත දක්වා ඇති සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවන්ගෙන්, ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිලියෙල වූ අයදුම් පත් 1969 මැයි 15 දිනට හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතුයි. කවරයේ ඉහල වම් කෙළවරේ ''යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා පිළිබඳ උපදේශක තනතුර'' යනුවෙන් පැහැදිළිව සඳහන් කළ යුතුය (මෙම ඇබෑර්තු ඇත්තේ අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේය.)

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වේ. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිලධාරියකු තෝරාගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ඇත.

3. මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙක්ම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය:—

(I) 1969.5.15 වන දිනට වයස අවුරුදු 21 ට නො අඩු අවුරුදු 40ට නො වැඩි බව, (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහල වයස් සීමාව අදාල නොවේ.)

(II) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව ;

(III) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රයෙන් හෝ ;
(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව හා අංක ගණිතය හෝ ගණිතය ඇතුළු විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙල) විභාගයෙන් හෝ ;
(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්ව සිටින බව ; සහ

(IV) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා විෂයයන් සහිතව පිළිගත් විශ්ව විද්‍යාල යකින් ඉංජිනේරු විද්‍යා උපාධියක් ලබා තිබීම. (ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද ලත් අයට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.) හෝ

(V) යාන්ත්‍රික ඉංජිනේරුවන්ගේ ආයතනයේ වෘත්තීය (Professional) විභාගයන්හි 1 වැනි, 2 වැනි සහ 3 වැනි කොටස් සමත්වීම. (ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද ලත් අයට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.) ; නැතහොත්

(VI) ලංකා කාර්මික විද්‍යාලයේ (යාන්ත්‍රික ඉංජිනේරු) සන්ධ්‍යා සහතිකය සහ 5 අවුරුදු ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම. (පහත සටහන බලන්න) ; හෝ

(VII) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (විදුලි සහ යාන්ත්‍රික) සහතිකය සහ 5 අවුරුදු ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම. (පහත සටහන් බලන්න) ; හෝ

(VIII) සමාන හෝ උසස් සුදුසුකම් ; සහ

(IX) සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් තිබිය යුතුයි. නැතහොත් පත්වීම ලැබී අවුරුදු 3ක් ඇතුලත සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් ලබා ගත යුතුයි.

**සටහන.**—ඉහත (VI), (VII) සහ (VIII) යටතේ පත්කරගනු ලබන්නා සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර අවුරුදු 5 කට අඩු පළපුරුද්දක් ඇති අයෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු අවශ්‍ය පළපුරුද්ද ලබාගන්නා තෙක් වසකට රු. 3,420 ක නියමිත වැටුපක් මත වැඩ බැලීමේ පදනමක් මත පත් කෙරෙනු ඇත.

4. **මෙම තනතුරට අයත් වාර්ෂික වැටුප් ක්‍රමය.**—රු. 3,420—120 × 4 සහ 180 × 8—රු. 5,340 වේ. රු. 4,080 සහ රු. 4,800 ඉක්මවා යෑමට පෙර කාර්යක්ෂමතා කඩඉම්වලින් සමත් විය යුතුය.

5. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියම අවස්ථාවේ දී ලැබී, ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත් භාරගනු ලැබේ. තවද සෑම අයදුම්කරුවකුම තම අයදුම් පත්‍රයේ පිටපතක් කෙළින්ම මෙම අමාත්‍යාංශය වෙත එවිය යුතුයි.

6. අයදුම්කරුවන් විසින් පහත දක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ.) ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලා වලට ඇතුලත්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය භාරගත නොහැක.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සහතික ;

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික 3ක් ;

(**සැළකිය යුතුය.**—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනුඡෙදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවුවමනාය.)

7. ඉල්ලුම් පත්‍ර හා අනෙකුත් අදල ලියකියවිලි, මෙම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැනට හැර වෙනත් කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමු වැනි කොටසේ දෙවන ඡෙදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය පසුවී දින 14ක් ගෙවුනු කළ පිළිතුරක් නො ලදහොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දන්විය යුතුය කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමිවනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 අප්‍රේල් 15 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

## ඉල්ලුම් පත්‍රය

(අඟල් 8½ × 13½ ප්‍රමාණයේ ෆුල්ස්කැප් කඩදසිවල සකස් කළ යුතුයි)

**අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය—යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා පිළිබඳ උපදේශක තනතුර**

සැදහුම : සාප/3/207

1. සම්පූර්ණ නම (පැහැදිලි ලෙස ලියන්න) :————.
(මහතා/මහත්මිය/මෙනවිය)

2. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි)

3. ජාතිය :————.
(ලාංකික වන්නේ (අ) පරම්පරාවෙන්ද, (ආ) ලියා පදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ, ලියා පදිංචි කිරීමෙන් නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදහුම් අංකයත් සඳහන් කරන්න.)

4. (අ) අයදුම් පත් භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු : ————, මාස : ————, දින : ————.

(ආ) උපන් දිනය :—
අවුරුද්ද :————, මාස :————, දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් අමුණන්න.)

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) ඔහුගේ/ඇගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ සීයා :————.

(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. (අ) විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.
(ආ) විවාහක නම්, (i) විවාහ වූ දිනය :————.
(ii) ළමයි ගණන :————.

7. (අ) වයස අවුරුදු 15 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපන | | | වෘත්තීය/කාර්මික අධ්‍යාපනය (ලබා ඇත්නම්) | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |

(ආ) අන්තිමට ඉගෙනගත් පාසලෙන් අස්වූ දිනය :————.

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය, දිනයන් සමග :—
(අ) සිංහල :————.
(ආ) ඉංග්‍රීසි :————.
(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර (අ) ලැබූ දින හා (ආ) ආයතනවල නම් ද සඳහන් කරන්න :————.

10. කියවීම, ලිවීම, කථා කිරීම හා භාෂා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් තිබේද ?
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

11. විශේෂ සුදුසුකම් :————.
(නිවේදනයෙහි සඳහන් කොට ඇති, විශේෂ සුදුසුකම් හා/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින, වකවානු සහිතව සඳහන් කරන්න.)

12. කිසියම් අපරාධ වරදක් නිසා, අධිකරණය මගින් වරදකරු කරනු ලැබේ ද ? එසේ නම් (අ) දිනය (ආ) නඩු නොම්මරය හා (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

13. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නොවේ නම්, ඔබේ ණයකුරුස්වල ප්‍රමාණය කොපමණ ද ? :————.

14. වෙනත් විස්තර (වෙනත් විශේෂ හිමිකම් ආදිය) :————.

15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම (මේ සහතිකවල පිටපත් මිස, මුල් ලිපි ඉදිරිපත් නො කළ යුතුයි. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම්, මේ අවශ්‍ය නැත.) :————.

16. සේවා මුක්ත භටයෙක් නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුන හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

17. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා :—
(I) දරන ලද තනතුර :————.
(II) නියුක්තව සිටි දින වකවානුව :————.
(III) අස්වීමට හේතුව :————.

(ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්, (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර, (ආ) සේවයේ යෙදී සිටි දින, (ඇ) සේවය නතර කිරීමට හේතුව සඳහන් කරන්න :————.

18. දැනට යෙදී සිටින රක්ෂාව :—
(I) (අ) තනතුර, ශ්‍රේණිය හා (ආ) ඊට පත්වූ දිනය :————.
(II) විශ්‍රාම වැටුප් සහිත ද ? තාවකාලික හෝ අනියම් ද ? :————.
(III) (දීමනා රහිතව) දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය :————.
(IV) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර, සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

## ජාතික විද්‍යා සභාව

### ලේකම් ජනරාල් තනතුර

ඉහතකී තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර භාරගනු ලැබේ. ජාතික විද්‍යා සභාවේ ලේකම් ජනරාල් වරයා, 1968 අංක 9 දරණ ජාතික විද්‍යා සභා පනතේ 18 (1) වැනි වගන්තිය අනුව, එකී සභාවේ ප්‍රධාන විධායක නිලධාරී වේ.

2. **සුදුසුකම් සහ යෝග්‍යතා.**—අයදුම්කරුවන්, පහත සඳහන් සුදුසුකම් සහිත පළමුවෙනි හෝ දෙවෙනි පෙළ ගෞරව උපාධිය ලබා ඇති "විද්‍යා උපාධිධරයන්" * විය යුතුය :—

(අ) ශුද්ධ හෝ ව්‍යවහාරික විද්‍යාව (වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු ශිල්පය සහ සමාජ විද්‍යාව ඇතුළුව) පිළිබඳ කිසියම් ක්ෂෙත්‍රයක පිළිගත් පශ්චාත් උපාධි ශාස්ත්‍රීය/වෘත්තිය සුදුසුකම් සහ

(ආ) (i) පර්යේෂණ හා උසස් අධ්‍යාපනය හෝ

(ii) ශුද්ධ සහ ව්‍යවහාරික විද්‍යා පිළිබඳ ක්ෂේත්‍රවල පර්යේෂණ හා සංවර්ධන වැඩ පිළිබඳ යටත් පිරිසෙයින් අවුරුදු 10ක පළපුරුද්දක් සහ සනාථකළ හැකි සාමාර්ථයක්.

*සංලක්ෂය.—"විද්‍යා උපාධිධරයන්" යනුවෙන් අදහස් වන්නේ විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව සහ සමාජ විද්‍යා පීඨවලින් සාමාර්ථය ලැබූ උපාධිධරයන් ය.

3. අයදුම්කරුවන් ලාංකිකයන් විය යුතු අතර වයස අවුරුදු 50 ට අඩු අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට හිමි වැටුප මෙසේ ය : මසකට රු. 1,500—50×10—රු. 2,000 (සියළු දීමනා ඇතුළුව). විශේෂ සුදුසුකම් ඇති අයදුම්කරුවන් සිටී නම්, මසකට රු. 2,250ක උපරිම වැටුපක් සඳහා සලකා බැලිය හැකිය). තෝරා ගනු ලැබූ අයදුම්කරුගේ පළපුරුද්ද සහ සුදුසුකම් අනුව, මෙම වැටුප් ක්‍රමයේ සුදුසු පියවරක තබනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—රාජ්‍ය සේවයෙහි සිටින නිලධාරීන් මෙම තනතුරට ද්විතීයනය කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් 1968 අංක 9 දරණ ජාතික විද්‍යා සභා පනතේ 20 (2) වැනි වගන්තිය අදාල වේ.

5. පත්වීම ප්‍රථමයෙන්, පස් අවුරුදු ගිවිසුමකට යටත් වේ. එම කාලයට එක් අවුරුද්දක ප්‍රවාසන කාලසීමාවක් ද ඇතුළත් වේ.

6. මෙම තනතුර සඳහා තෝරාගනු ලබන අයට අර්ථ සාධක අරමුදලට හිමිකම් ලැබේ.

7. රජයේ දෙපාර්තමේන්තු, රජයේ සංයුක්ත මණ්ඩල සහ එවැනි අනිකුත් ආයතනවල නියුක්ත සේවකයන්ගේ අයදුම්පත්‍ර ඒ ඒ දෙපාර්තමේන්තු, සංයුක්ත මංඩල හෝ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

8. වැඩිදුර විස්තර කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ, අංක 69 දරණ ස්ථානයේ ජාතික විද්‍යා සභාවේ වැඩ බලන ලේකම් ජනරාල්වරයාගෙන් ලබාගත හැකිය.

9. අයදුම්පත් පෝර්ම ඉහතකී ස්ථානයෙන් ලබාගත හැකි අතර, ඒවා **1969 මැයි 7 වෙනි දිනට** පෙර (ලියාපදිංචි තැපැලෙන්) කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 69 හි, ජාතික විද්‍යා සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

නිකුලස් ආටිගල,
සභාපති,
ජාතික විද්‍යා සභාව.

1969 අප්‍රේල් මස 18 දින.

**4–814—69.4.25 දින අංක 14,851 දරන ගැසට් පත්‍රය**

---

අංකය : විඅා/3/78.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ඩෙන්මාර්ක් රජයේ ශිෂ්‍යත්ව

කෝපන්හේගන්හි ලලිත කලා ආයතනයේ වාස්තු විද්‍යා පාසලේ වාස්තු විද්‍යාව පිළිබඳ අධ්‍යාපනය සඳහා ඩෙන්මාර්ක් රජය විසින් පිරිනැමෙන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂ්‍යය 1.**—රජයේ සේවකයන්ගෙන් අයදුම්පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍රලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

**සංලක්ෂ්‍යය 2.**—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම්පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම්පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතුය.

**සංලක්ෂ්‍යය 3.**—එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම්පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් වර්ෂයක් වන්නේ ය. ශිෂ්‍යත්වධාරියකුගේ අධ්‍යාපනය සඳහා ප්‍රධාන වශයෙන් වැදගත් වන්නේ නම් පමණක්, වර්ෂයකට වැඩි නොවන අමතර කාලයක් සඳහා ශිෂ්‍යත්ව දීර්ඝ කරනු ලැබීමට ඉඩ තිබේ.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ ඩෙන්මාර්ක් බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1969.9.1 වැනි දිනට, වයස අවුරුදු 35 ට අඩු විය යුතුයි.

(iii) ආර්.අයි.බී.ඒ. අන්තර් මධ්‍ය පරීක්ෂණය සම්පූර්ණ කොට තිබිය යුතුයි. (මෙම පරීක්ෂණය එකම වතාවකදී සම්පූර්ණ කොට ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

(iv) උසස් ඉංග්‍රීසි ප්‍රවීණත්වයක් තිබිය යුතුයි.

**සංලක්ෂ්‍යය 1.**—රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1969.9.1 වැනි දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂ්‍යය 2.**—එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන් ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම්පතේ 15(ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) ඩෙන්මාර්කයට යාම සහ ආපසු පැමිණීම සඳහා ගමන් වියදම්;

(ආ) යැපීම් දීමනාවක් ;

(ඇ) නොමිලයේ ඉගැන්වීම.

**සංලක්ෂ්‍යය.**—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියකියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතුය.

6. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් ඩෙන්මාර්කය බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත් රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

### එක්සත් රාජධානියේ පුහුණුව සඳහා අයදුම්පතේ ආකෘතිය

**I වැනි කොටස**

(1) අයදුම් කර සිටින පාඨ මාලාව :————.

(2) නිලධාරියාගේ නම (අග නම මුලට) :————.

(3) උපන් දිනය :————.

(4) සේවය හා ශ්‍රේණිය :————.

(5) රාජ්‍ය සේවයට බැඳුණු දිනය :————.

(6) රාජ්‍ය සේවයේ දැරූ තනතුරු සහ දින වකවානු :————.

(7) ශාස්ත්‍රීය සුදුසුකම් :————.

(8) භාෂා ප්‍රවීණත්වය :————.

(9) නිලධාරියා සහභාගිවී ඇති විදේශ අභ්‍යාස පාඨ මාලා, සම්මන්ත්‍රණ, සාකච්ඡා සම්මේලන ආදියේ විස්තර :————.

(10) නිලධාරියා ලංකාවේදී හදාරා ඇති අභ්‍යාස පාඨමාලා හෝ වෙනත් ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ විස්තර :————.

(11) ඉහත 9 වෙනි හා 10 වැනි අංකයන් යටතේ දක්වා ඇති කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් යම් විශේෂ කාර්ය ක්ෂේත්‍රයක නිලධාරියා ඇති කර ඇති වෙනස්කම් හා වැඩිදියුණු කිරීම් පිළිබඳ විස්තර :————.

(12) විශේෂයෙන් මේ පාඨ මාලාව ඔබ තෝරා ගන්නේ කුමක් නිසාද යනු සැකෙවින් දක්වන්න :————.

මා විසින් සපයා ඇති ප්‍රකාශයන් මගේ හොඳම විශ්වාසයේ හැටියට සත්‍ය බවත් නිවැරදි බවත්, .............................. වන මම සහතික කරමි.

පුහුණුව සඳහා පිළිගනු ලැබුවහොත්, ලංකා රජය සඳහා හා ඒ වෙනුවට පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන උපදෙස් පිළිපැදීමටත් කොන්දේසිවලට අනුව ක්‍රියා කිරීමටත් මම පොරොන්දු වෙමි.

දිනය :————. අත්සන :————.

**II වැනි කොටස**

.............................. දෙපාර්තමේන්තුවේ ..............................
(පදවි නාමය)

..............................මහතාගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත්
(නම)
කරමි.

තෝරා ගනු ලැබුවහොත් අභ්‍යාස පාඨ මාලාව හැදෑරීම සඳහා ඔහු මුදා හරිනු ලැබේ.

..............................
අමාත්‍යංශයේ ස්ථිර ලේකම්.

දිනය :————.

4–813—69.4.25 දින අංක 14,851 දරන ගැසට් පත්‍රය

---

### ලංකා ප්‍රමිති කාර්යාංශය

**සැළසුම්කරු-චිත්‍ර ශිල්පී තනතුර**

ලංකා ප්‍රමිති කාර්යාංශයේ ඉහත සඳහන් තනතුරට පත් කිරීම පිණිස නියමිත සුදුසුකම් ඇති ලාංකිකයින්ගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

**වයස.**—අවුරුදු 35ට නොවැඩි නුම් නොනිවී.

**සුදුසුකම් :**

(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙවතාවකට වැඩි නොවන වාර ගණනක දී විෂයයන් 6කින් සාමාර්ථය ලත් අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය),

සහ

(ii) ලංකා කාර්මික විද්‍යාලයේ සැළසුම්කරු සහතිකය,

සහ

(iii) චිත්‍ර ශිල්පය පිළිබඳ හැකියාව,

සහ

(iv) සිංහලෙන් වැඩ කිරීමේ හැකිකම.

**වැටුප් ක්‍රමය.**—රු. 345—රු. 15×7—රු. 450 (සියල්ල අඩංගු මාසික)

අවශ්‍ය අඩු ම සුදුසුකම්වලට වඩා වැඩි සුදුසුකම් ඇති අයට යට කී වැටුප් ක්‍රමයේ පියවරක තැබීමේ සුදුසුකම් ඇත.

**අර්ථසාධක අරමුදලට දායක වීම්.**—සියයට 4ක් නිලධාරියාගෙන් හා සියයට 6ක් ලංකා ප්‍රමිති කාර්යාංශයෙන්.

තෝරා ගන්නා අය අවුරුදු 3ක ආධුනික කාලයකට යටත් වෙති.

පහත සඳහන් ආදර්ශ අයදුම්පත්‍රය අනුව තම අත් අකුරින් සකස් කළ ඉල්ලුම්පත්‍ර 1969 මැයි 15 දින හෝ ඊට පෙර, අධ්‍යක්ෂ, ලංකා ප්‍රමිති කාර්යාංශය, 141/2, වජිර පාර, කොළඹ 5 වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතු වේ.

**සැළකිය යුතුයි.**—ඉල්ලුම්පත් එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "සැළසුම්කරු-චිත්‍ර ශිල්පී තනතුර" යන්න සඳහන් කළ යුතු යි.

රජයේ සේවයේ හෝ සංස්ථාවල හෝ සිටින අය තම ඉල්ලුම් පත්‍ර එම දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවල හෝ ප්‍රධානීන් ගේ මාර්ගයෙන් එවිය යුතු අතර ඔවුන් තෝරා ගැණුන හොත් නිදහස් කිරීමට එකඟ දැයි දැන්විය යුතු ය.

තෝරා ගන්නා අය 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලු ම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පැනවෙන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූල ව ක්‍රියා කිරීමට එකඟ විය යුත්තා හ.

ඉල්ලුම්පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් ලිපි නොව) අමුණා එවිය යුතු ය :—

(1) උප්පැන්න සහතිකය
(2) සුදුසුකම් පිළිබඳ සහතික
(3) ළඟදී ලබාගත් චරිත සහතික 2ක්.

ඉල්ලුම්පත්‍රය ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

අධ්‍යක්ෂ,
ලංකා ප්‍රමිති කාර්යාංශය.

දිනය :————.

#### ආදර්ශ අයදුම් පත්‍රය

**ලංකා ප්‍රමිති කාර්යාංශය**

**පුරප්පාඩු—ඉල්ලුම්පත්‍රය**

1. ඉල්ලුම්කරන නිලය :————.
2. ඉල්ලුම්කරු ගේ සම්පූර්ණ නම :————.
3. ලිපිනය :————.
4. (අ) උපන් දිනය :————.
   (ආ) ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස :————.
5. ජාතිය :————.
6. සුදුසුකම් :—
   (i) අධ්‍යාපනික (විෂයයන් සමග) :————.
   (ii) සැළසුම්කරු :————.
   (iii) චිත්‍ර ශිල්පීය :————.
7. පාසැලෙන් අස්වීමෙන් පසු කළ රක්ෂා දින සහිත ව (දැරූ නිල සහ ලැබූ වැටුප් පිළිබඳ විස්තර දිය යුතු යි) :————.
8. විශේෂ සුදුසුකම් (ඇත්නම්) :————.
9. සිංහල ප්‍රවීණතාව :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

4–735—69.4.25 දින අංක 14,851 දරන ගැසට් පත්‍රය

---

### ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය

**නානායම් කළමනාකාර තනතුර**

යථෝක්ත තනතුර සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 1969 මැයි 7 වැනි දින වේ.

**වයස.**—1969 අප්‍රේල් මස 1 වන දිනට වයස අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි අය විය යුතුයි.

**අධ්‍යාපනය.**—ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා දැනුමක් සහිත සාමාන්‍යයෙන් හොඳ අධ්‍යාපනයක් ඇති අය විය යුතුයි.

**පළපුරුද්ද.**—උසස් පෙළේ භොජනාගාරයක් හෝ ආපනශාලාවක් පවත්වාගෙන යාමේ පළපුරුද්දක් තිබීම.

නවීන නානායමක් පවත්වාගෙන යාමේ හැකියාව සහ දැනුම ඇති අපේක්ෂකයන් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් පරිමාව.**—අවුරුද්දකට රු. 1,200—72—රු. 1,920 සහ දීමනා ගෙවනු ලැබේ.

අයදුම්පත් සහ වැඩිමනත් විස්තර මෙහි පහත අත්සන් කර ඇති අයගෙන් ලබා ගත හැක.

ඉල්ලුම් කර ඇති තනතුර අයදුම්පත බහා ඇති ලියුම් කවරයේ වම් ඉහළ කෙළවරෙහි දැක්විය යුතුයි.

ආර්. වී. ජයසූරිය,
ප්‍රධාන ලේකම්,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

415, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7,
1969 මාර්තු මස 28 වැනි දා.

4–819—69.4.25 දින අංක 14,851 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ගුරු විදුහල් ප්‍රවේශය — සිංහල/දෙමළ සාමාන්‍ය පාඨමාලාව—ගුරුවරුන්

සිංහල/දෙමළ සාමාන්‍ය පාඨමාලාව සඳහා ගුරු විද්‍යාල්වලට පුහුණුව පිණිස ගුරුවරුන් තෝරා ගැනීමේ දී පහත සඳහන් අතිරේක අධ්‍යාපනික සුදුසුකම් ඇති අයට වැඩි සැලකිල්ලක් දැක්වීමට තීරණය කර ඇත.

1. අ. පො. ස. (උ. පෙළ) ... සිංහල/දෙමළ සාමාර්ථය
2. අ. පො. ස. (උ. පෙළ) ... භූගෝල විද්‍යා සාමාර්ථය
3. අ. පො. ස. (උ. පෙළ) ... ඉතිහාසය/ආණ්ඩුක්‍රම/ආර්ථික විද්‍යා සාමාර්ථය
4. අ. පො. ස. (සා. පෙළ) ... ගණිතය
5. අ. පො. ස. (සා. පෙළ) ... භෞතික විද්‍යාව/රසායන විද්‍යාව /ජෛව විද්‍යාව/කෘෂිකර්මය

මෙම තීරණය පහත සඳහන් අයුරු ක්‍රියාත්මක කරනු ඇත.

2. ගුරු විදුහල් ප්‍රවේශ විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති සහ ඉහත සඳහන් අතිරේක අධ්‍යාපනික සුදුසුකම් පහත සඳහන් ආකාරයෙන් ඇති අය ගුරු විදුහල් ප්‍රවේශ විභාගයෙන් නිදහස් කර සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. සෑම අවුරුද්දකම අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල ප්‍රසිද්ධ කළායින් පසු මෙවැනි අයගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

1970 සහ 1971 වර්ෂවල ඉහත සඳහන් අතිරේක විෂයයන් 5 න් අඩු වශයෙන් විෂයයන් 3ක් ද,

1972, 1973, 1974 වර්ෂවල ඉහත සඳහන් අතිරේක විෂයයන් 5න් අඩු වශයෙන් විෂයයන් 4 ක්ද,

1975 වර්ෂයේ සහ ඉන්පසු ඉහත සඳහන් අතිරේක විෂයයන් 5 සම්පූර්ණයෙන් ද වේ.

අනිකුත් අයට ගුරු විදුහල් ප්‍රවේශ පරීක්ෂණ විභාගය දිගටම පැවැත්වෙන්නේ යථා පරිදිය. ඉහත කී පරිපාටිය අනුව, ප්‍රවේශ පරීක්ෂණයෙන් පිටස්තරව තෝරාගනු ලබන සංඛ්‍යාව අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් ඒ ඒ වර්ෂයේ දී තීරණය කරනු ලැබේ.

ඩී. ජී. දයාරත්න,
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1969 අප්‍රියේල් මස 14 වැනිදින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදී ය.

4–700—69.4.25 දින අංක 14,851 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් ස්ථානාධිපති සහ සංඥාදායකයින්ගේ විභාගය—1967 නොවැම්බර්

අංක 14,829 සහ 1968 නොවැම්බර් 22 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කළ 1968 නොවැම්බර් මස 15 වැනි දින දරණ නිවේදනයට අමතරවයි. 1967 නොවැම්බර් මාසයේ පැවැත් වූ විභාගයේ ප්‍රතිඵල අනුව, පහත නම් සඳහන් අයදුම්කරුවන්ද තැපැල් ස්ථානාධිපති සහ සංඥාදායක සේවයට පත් කිරීම සඳහා තෝරාගෙන ඇති බැව් මෙයින් නිවේදනය කෙරේ :—

| නම | | ලිපිනය |
|---|---|---|
| අමරසිරි, බෙ. හේ. | ... | " දයානි ", කපුහේන, ගෝනගලපුර, ඉදුරුව. |
| කනගරත්නම්, මු. | ... | නයිනාවත්ත, වරතුපලෙයි, පේදුරුතුඩුව. |
| ගුණපාල, අ. | ... | දෙල්ගොඩ, දවිගලගම, රත්නපුර. |
| ගුණවර්ධන, පෙ. වි. වි. | ... | 3 වන අංශය, තැපැල් කාර්යාල ඉතිරි කිරීමේ බැංකුව, කොළඹ 3. |
| චන්ද්‍රවංශ, ව. වි. චා. | ... | අංක 89, ජෝර්ජ් ආර්. ද සිල්වා මාවත, කොළඹ 13, |
| ත්‍යාගරාජා, සී. | ... | ආලියාවලෙයි, චෙම්පියන්පත්තු. |
| ද මැල්, වි. f්‍රැ. ස්ටැ. ජ. | ... | අංක 13/5, ප්‍රනාන්දු පෙදෙස, මොරටුවැල්ල, මොරටුව. |
| දයානන්ද, ශ්‍රී. ල. ආ. | ... | " පුෂ්පලතා ", පොහොසතුගොඩ, බඹරැන්ද, කෝට්ටෙගොඩ. |
| දයාරත්න, සූ. බ. | ... | දෙසියන්දරගෙදර, දෙනගම, හක්මන. |
| පලනිවෙල්, ක. | ... | කොට්ඨාශ අංක 1, අන්නලේතිවු. |
| පියදාස, වි. ම. ප. | ... | " වික්‍රම සෙවන ", ඌරුමුත්ත, බෝපාගොඩ, අකුරැස්ස. |
| පියසේන, ග. ගෙ. | ... | වරාගොඩ, මොලගොඩ. |
| පීටර්ස්. ඔ. හෙ. | ... | ' ප්‍රියන්ත ', වෙන්නප්පුව. |
| පේමසිරි, හේ ලි. | ... | කිරිවත්තුඩුව, සුල්තානාගොඩ, මාතර. |
| ප්‍රනාන්දු, ක. ක. නි. ජ. | ... | හලා/හාල්දඹුවන බෞද්ධ මිශ්‍ර රජයේ පාසැල (ඉදිරිපිට) දංකොටුව. |
| බාලචන්ද්‍ර, රා. ඇ. ක්‍රි. | ... | 157, ත්‍රිකුණාමලය පාර, මඩකලපුව. |
| මනෝහරන්, සෙ. | ... | " සත්‍යගිරි ", තිරුවිල්, වල්වෙට්ටිතුරෙයි |
| මුතුකුමාරස්වාමි, සී. | ... | පාහුතෝවන්පුලම්, කාවඩි උතුර, කොකුවිල්. |
| මුරුගේසු, නා. | ... | ඉඩ්ඩායිකඩු (උතුර), අච්චුවේලි. |
| රත්නසිංගම්, සෙ. | ... | ලිපිගණුදෙනු අංශය, පොලිස් මූලස්ථානය, කොළඹ 1. |
| රාමනායක, රා. ක. පි. | ... | " චන්ද්‍රා ", උඩුගොඩ, රුක්ගහවිල. |
| වික්‍රමසිංහ, පි. ම. ප. | ... | යක්දෙහිවත්ත, පෝරතොට, අකුරැස්ස. |
| වෛයිතීස්වරන්, සී. | ... | චූලිපුරම්. |
| සනාතනන්දන්, වෛ. | ... | වියාපාරිමූලායි, පේදුරුතුඩුව. |
| සත්කුනලිංගම්, නා. | ... | පුනාරිමත්තඩි, කේ. කේ. ඇස්. පාර, කොකුවිල්. |
| සිල්වා, ග. ජෝ. | ... | 188, ඉද්දගොඩැල්ල පාර, කිඹුලාපිටිය, මීගමුව. |
| සුමනදාස, මා. | ... | පොලිස් අභ්‍යාස විද්‍යාලයය, (කාර්යාලය) ඇවිලන් චතුරශ්‍රය, කොළඹ 1. |
| සෝමරත්න, කු. හෙ. | ... | පනාවල, නිට්ටඹුව. |
| සෝමසේකරන්, ර. | ... | ටෙම්පල් ස්ක්වෙයාර්, තුන්නලෙයි දකුණ කරවෙඩ්ඩි. |

2. පහත නම් සඳහන් අයදුම්කරුවන්, තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ, කණිෂ්ඨ සේවකයින් සඳහා වන සීමිත තරඟය යටතේ තැපැල් ස්ථානාධිපති සහ සංඥාදායක සේවයට පත් කිරීම සඳහා තෝරාගෙන ඇත :—

| | | |
|---|---|---|
| ආරියදාස, මා. රො. | ... | ප්‍රධාන තැපැල් ස්ථානාධිපති කාර්යාලය, කොළඹ 1. |
| ආරියසිංහ, ර. | ... | සහකාර උපකරණ අධිකාරි, (ගො) කාර්යාලය, කොළඹ 5. |
| ඇපා, පී. | ... | තැපැල් කාර්යාලය, ඇල්පිටිය. |
| එඩ්වින්, ජෝ. | ... | තැපැල් කාර්යාලය, ගාල්ල |
| කරුණාදාස, ප. වි. | ... | තැපැල් කාර්යාලය, වැලිගම. |
| කරුණාසේන, ප. දො. | ... | තැපැල් කාර්යාලය, ඉංගිරිය. |
| කෝල්ටන්, පා. ජේ. | ... | තැපැල් කාර්යාලය, නාවලපිටිය. |
| ගුණපාල, කැ. ප. | ... | ප්‍රධාන තැපැල් ස්ථානාධිපති කාර්යාලය, කොළඹ 1. |
| ජයවර්ධන, ම. | ... | තැපැල් කාර්යාලය, නිට්ටඹුව. |
| ජයසේකර, කො. හෙ. දෙ. fපො. | | තැපැල් කාර්යාලය, බෙන්තොට. |
| තිරුනාවරුජා, වෙ. | ... | තැපැල් කාර්යාලය, පේදුරතුඩුව. |
| ධනපාල, ජ. | ... | ප්‍රධාන තැපැල් ස්ථානාධිපති කායර්ාලය, කොළඹ 1. |
| ධම්දාස, වා. පි. ල. | ... | විදේශ විදුලි සංදේශ අංශය, කොළඹ 1. |
| ධම්රත්න, ර. ක. | ... | තැපැල් කාර්යාලය, යක්කල. |
| පරමසිවම්, සු. | ... | ප්‍රධාන විදුලි පණිවුඩ ස්ථානාධිපති කාර්යාලය, කොළඹ 1. |
| පීරිස්, නා. ජ. | ... | තැපැල් කාර්යාලය, ගල්කිස්ස. |
| පේමදාස, ප. ආ. | ... | තැපැල් කාර්යාලය, රත්නපුර. |
| ප්‍රනාන්දු, හ. ජී. | ... | ප්‍රධාන විදුලි පණිවුඩ ස්ථානාධිපති කාර්යාලය, කොළඹ 1. |
| බාලසුන්දරම් පිල්ලෙයි, න. | | තැපැල් කාර්යාලය, වේලානෙයි. |
| මුතුකුමාරණ, හෙ. ටො. හී. | | තැපැල් කාර්යාලය, දික්වැල්ල. |
| රාජදුරෙයි, සී. | ... | තැපැල් කාර්යාලය, කොකුවිල්. |
| රාසයියා, ක. | ... | තැපැල් කාර්යාලය, නැදුන්කර්නි. |

| නම | | ලිපිනය |
|---|---|---|
| විජේසිරි, උ. ක. | ... | තැපැල් කාර්යාලය. පන්විල. |
| සිල්වා, දො. ධ. | ... | තැපැල් කාර්යාලය, මහරගම. |
| සීලදාස, උ. | ... | තැපැල් කාර්යාලය, යටියන්තොට. |
| සුගතදාස, නා. කු. | ... | ප්‍රධාන තැපැල් ස්ථානාධිපති කාර්යාලය, කොළඹ 1. |
| සෙබමාලෙයි, ස. | ... | තැපැල් කාර්යාලය, තලෙයිමන් නාරම. |
| සෝමදාස, අ. ආ. දො. | ... | තැපැල් කාර්යාලය, වැලිමඩ. |

3. මෙම අපේක්ෂකයින්ට වහාම තනතුරු සැපයීමට ආණ්ඩුව පොරොන්දු නොවේ. එහෙත් පුරප්පාඩු ඇතිවන පරිද්දෙන් ඔවුනට පත්වීම් දෙනු ඇත. සියළුම පත්වීම් අවුරුදු තුනක ආධුනික කාලයකට සහ සේවය පිළිබඳ කොන්දේසිවලට යටත් වේ.

4. යථා කාලයේදී මා විසින් අපේක්ෂකයින් වෙත ලියා දන්වනු ඇත.

වී. ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්‍ෂ.

1969 අප්‍රේල් මස 14 වැනි දින,
කොළඹ 1,
තැපැල් සහ විදුලි සන්දේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ,
6 වන මහලෙහි
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්‍ෂ කාර්යාලයේදීය.

4–805—69.4.25 දින අංක 14,851 දරන ගැසට් පත්‍රය

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ධීවර දෙපාර්තමේන්තුව

කොළඹ ධීවර දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සඳහා 1969. 5. 15 වෙනි දින පූ. භා. 10.30 දක්වා ධීවර අධ්‍යක්ෂ විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර්පත්‍ර 1969.5.14 වෙනි දින දවල් 12 වන තෙක් ධීවර දෙපාර්තමේන්තුවේ ආයතන ශාඛාවෙන් ලබා ගත හැක. ආපසු ලබා ගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදල රු. 100 කි.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

කොළඹ, ගාලු මුවදොර,
ධීවර දෙපාර්තමේන්තුවේදී ය.

4–752—69.4.25 දින අංක 14,851 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—අම්පාර උප කොටස

පහත දැක්වෙන වැඩ කිරීම සඳහා ඉදිරිපත්කරනු ලබන ටෙන්ඩර් අයදුම් පත් 1969 මැයි මස 25 වෙනි ඉරිදා පෙරවරු 10 දක්වා මඩකලපුව නැගෙණහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එම වැඩ ඉදිරියේ දක්වා ඇති අයුරු හෝ ඊට වැඩි ගණන්වලට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා අයදුම් පත් ඉදිරිපත් කළහැක.

| ටෙන්ඩර් අංකය | | වැඩයේ නම | ලියාපදිංචිවූ ගණන | | තැන්පත් මුදල |
|---|---|---|---|---|---|
| | | | රු. | | රු. |
| අ/28/68–69 | ... | සම්මන්තුර තුන්වන සැතපුම අසල ඕවර්සියර්වරුන් ගේ නිවසක් ඉදිකිරීම | 25,000 | ... | 25 |
| අ/29/68–69 | ... | වීරගොඩ දිය බෙදුම අසල ඕවර් සියර්වරුන්ගේ නිවාසයක් ඉදිකිරීම | 25,000 | ... | 25 |
| අ/30/68–69 | ... | ගල්ඔය වම් ඉවුරේ එල්. බී. ඇල අංක 15 ප්‍රකෘතිමත් කිරීම | 25,000 | ... | 25 |

1969 මැයි මස 21 වෙනි බදාදා සවස 4 දක්වා අම්පාර කල්මුණ, හා වෙන්කල්අඩි උප කොට්ඨාශයන්හි වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාය්‍යාලයන්ගෙන් කාර්යාල වේලාවන් තුලදී ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කොට එවිය යුතුය. ටෙන්ඩර් ආකෘති පත් සඳහා ඉල්ලුම් කිරීමේදී, ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර් කරුවන් ඔවුන් ගේ ලියාපදිංචිවීමේ පොත් සහ දැනට ඔවුන් කරන දෙපාර්තමේන්තුවේ වැඩ සහ ඒවායේ වටිනාකම පිළිබඳව ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ තිබේද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති නිකුත් කිරීමට පෙර, වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාය්‍යාලයේ ඉහත සඳහන් ප්‍රකාර ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කළයුතුව ඇති අතර, එසේ නැතහොත් දිසාපති කාය්‍යාලයක එවැනි තැන්පත් කිරීමක් කල බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. මෙම ටෙන්ඩර් පිළිබඳව වැඩි විස්තර අම්පාර උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාය්‍යාලයෙන් කාය්‍යාල වේලාවන් තුලදී ලබාගත හැක.

ජී. ඇම්. චන්ද්‍රදස,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
අම්පාර උප කොට්ඨාශය.

1969 අප්‍රේල් මස 10වෙනි දින,
අම්පාර උප කොට්ඨාශ වාරිමාර්ග කාය්‍යාලයේදීය.

4–746—69.4.25 දින අංක 14,851 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කුරුණෑගල උප කොට්ඨාශය

කුරුණෑගල උප කොට්ඨාශයේ පහත සඳහන් ඉදි කිරීම් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1969.5.20 වෙනි බදාදා පෙ.ව. 10.00 දක්වා කුරුණෑගල වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ.

| | වැඩ විස්තරය | | කොන්ත්‍රාත් කරුගේ ලියාපදිංචි මුදල | | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|---|---|
| | | | රු. | | රු. |
| 1. | කිඹුල්වාන වැව් බැම්ම ඉස්සීම | ... | 30,000 | ... | 50 |
| 2. | කිඹුල්වාන වැව් බැම්ම ඉස්සීම—ප්‍රසිද්ධ පාර ඉස්සීම හා වැඩිදියුණු කිරීම | | 26,000 | ... | 50 |
| 3. | තාරන්පිටිය අමුණ ඉදි කිරීම | ... | 85,000 | ... | 100 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහතින් දැක්වෙන ප්‍රමාණයට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1969.5.15 වෙනි (බ්‍රහස්පතින්දා) (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී කුරුණෑගල/නිකවැරටිය/පුත්තලම උප කොට්ඨාශ භාර වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාරයාලයෙන් ලබාගත හැකි ආකෘති පත් වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද ? නැද්ද ? යන්න සළකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කිරීමට ප්‍රථම ඉහත දැක්වෙන පිළිවෙළට ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩරය ගැන සියළුම විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැළසුම, විශේෂ විස්තරය යනාදිය කාර්යාල වේලාවන් තුළ දී කුරුණෑගල උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

එල්. හරිදස,
වාරිමාර්ග ඉංජිනේරු,
කුරුණෑගල උප කොට්ඨාශය.

1969 අප්‍රේල් මස 11 වෙනි දින,
කුරුණෑගල වාරිමාර්ග කාර්යාලයේදීය.

4–801—69.4.25 දින අංක 14,851 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### පොළොන්නරුව උප කොට්ඨාශය

1968-69 යන මුදල් වර්ෂයන් සඳහා පොළොන්නරුව උප කොට්ඨාශයෙ බඩු බාහිරාදිය ප්‍රවාහනය කිරීම සඳහා ඊශාන කොට්ඨාශයේ ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 69 මැයි මස 15 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තෙක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 10,000 හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් සහ සමුපකාර සහ ග්‍රාම සංවර්ධන සමිති වලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් කිරීමට සුසුදුකම් ඇත්තේ අඩු වශයෙන් ලොරි රථ දෙකක්වත් තමා නමින් ඇති කොන්ත්‍රාත්කරුවන්ට වන අතර ටෙන්ඩර් පත් ඉල්ලුම්කරන විට තමා නමින් ඇති වාහන ලියාපදිංචි කිරීමේ සහතිකයද ඉදිරිපත් කළ යුතුය.

3. පොළොන්නරුව, හිඟුරක්ගොඩ සහ කවුඩුල්ල වාරිමාර්ග කාර්යාලයන්හි ඉංජිනේරුතැනගේ 69 අප්‍රේල් 27 දින සිට 69 මැයි 15 වෙනි දින දක්වා කාර්යාල වේලාවන් තුළද ලබා ගත හැකි ටෙන්ඩර් පෝරම පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර්පත්‍ර ඉල්ලුම්කරන විට තමා කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචි වී ඇති රෙජිස්ටර් පොත සහ දැනට රජය යටතේ කරනු ලබන කොන්ත්‍රාත් වැඩ පිළිබඳ සහතිකයක්ද ඉදිරිපත් කළ යුතුය. කොළඹ හැර දිවයිනේ ඕනෑම කච්චේරියක රු. 25 මුදලක් තැන්පත් කොට ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කළ පසු පමණක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ඇත.

4. වැඩි විස්තර අවශ්‍ය වෙතොත් වාරිමාර්ග ඉංජිනේරු තැන පොළොන්නරුව වෙතින් ලබා ගත හැක.

ආර්. තුරෙයිරාජා,
වාරිමාර්ග ඉංජිනේරු-පොළොන්නරුව.

9. 4. 1969.

4-753—69.4.25 දින අංක 14,851 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අම්පාර දිස්ත්‍රික්කයේ සමන්තුරය ගොවිපලට උණබම්බු සැපයීම

ඉහත සඳහන් දේ සඳහා සීල් තබන ලද ටෙන්ඩර්පත් 1969.5.17 වනි දින පෙ. ව. 10 දක්වා යාපනයේ, කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා. නි.) විසින් භාරගනු ලැබේ.

1. **අම්පාර දිස්ත්‍රික්කයේ සමන්තුරය ගොවිපලට උණබම්බු 6,000ක් සැපයීම.**—එක් බම්බුවක ප්‍රමාණය අඟල් 12 සිට 16 දක්වා උසින්ද, අඟල් 4½ සිට 5 දක්වා විෂ්කම්භයකින්ද යුතුවිය යුතු අතර, සෑම බම්බුවකම යටි පතුලද විය යුතුයි. සියයකට අය කරන මිළ ගණන් දැක්විය යුතුයි. ගොවිපල කළමනාකරු තීරණය කරන පරිදි සැපයීම කළ යුතුයි. අවශ්‍ය වන දිනය හා එක් වරකට අවශ්‍ය වන ප්‍රමාණයත් ගොවිපල කළමනාකරු විසින් දන්වනු ඇත. පිළිගත් කොන්ත්‍රාත් කරු විසින් උණබම්බු මඩකලපුව දුම්රිය ස්ථානාධිපතිතැන බාරේ සමන්තුරය ගොවිපල කළමනාකරුට ලැබෙන සේ දුම්රියට පැටවිය යුතුයි. ප්‍රවාහන ගාස්තුව මෙම දෙපාර්තමේන්තුව මගින් දරණු ලැබේ.

පිළිගත් කොන්ත්‍රාත්කරු විසින් මෙම උණබම්බු ගොවිපල කළමනාකරුට හෝ ඔහුගේ නියෝජිතයාට හෝ දුම්රිය ස්ථානයේදී භාරදිය යුතුයි. ඉහතින් දී ඇති ප්‍රමාණයන් අනුව නොමැති සෑම උණබම්බුවක්ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2. ඉහත සඳහන් එක් එක් ස්ථානයේ එකී සේවාවන් සඳහා වෙන වෙනම ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර එකී එක් එක් ටෙන්ඩර්පත්‍රය උදෙසා රුපියල් 10 බැගින් ටෙන්ඩර් ගාස්තු තැම්පත් කළ යුතු වේ.

3. යාපනයේ කෘෂිකර්ම කායඹිලයේ කෘෂිකම් නිලධාරි (ගො. පා. හා. නි.) ගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. සියළුම ටෙන්ඩර්පත්‍ර දෙපිටපතකින් අත්සන් තබා මුද්‍රා තබන ලද කවරවල බහා එවිය යුතුයි. කවරයේ ඉහළ වම් කෙළවරේ (.........ස්ථානයේ නම සහ සේවාව සඳහන් කරන්න) සඳහා ටෙන්ඩර් පත්‍රයයි, යනුවෙන් සඳහන් කොට යාපනයේ කෘෂිකර්ම කායඹිලයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා. නි.) වෙත ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ටෙන්ඩර්පත්‍ර ලියා පදිංචි කළ තැපැලෙන් නොඑවන්නේ නම් සීල් තබන ලද කවරවල බහා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයා විසින් යාපනයේ කෘෂිකර්ම නිලධාරි කායඹිලයේ (ගො. පා. හා. නි.) ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කළ පසු ලියා පදිංචි කළ තැපැලෙන් ටෙන්ඩර් පත්‍රිකා එවන ලද ටෙන්ඩර්කරුවන් වෙත එම ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බව දන්වා එවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දින වශයෙන් සඳහන් දින සිට දින හතරක් ඇතුළත ටෙන්ඩර් පත්‍රය ලැබුණු බවට එවැනි ලිපියක් කිසියම් ටෙන්ඩර් කරුවෙකුට නොලැබුණි නම්, ඔහු විසින් යාපනයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා. නි.) වෙත ඒ බව නොපමාව දැන්විය යුතුය.

4. ටෙන්ඩරයකට රුපියල් 10 බැගින් මුදල් තැම්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ. මෙම තැම්පත් මුදල් කැමති කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලස්ථානයේ තැම්පත් කළ හැකිය. ගිවිසුම් පත්‍රය අත්සන් කළ පසු මේ තැම්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රය පිළිගන්නා ලද බව දැන්වූ දින සිට දින දහයක් ඇතුළත ගිවිසුම් පත්‍රයට අත්සන් තැබීමට පිළිගත් ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැම්පත් මුදල රාජසන්තක වනවාත් හැර ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමටද හේතුවේ. එහෙත් එයින් රජයට ඔහුගෙන් අය විය යුතු වෙනත් මුදලක් ඇතොත් එම අයකර ගැනීම්වලට බාධාවක් ඇති නොවේ. ගොවිපල කළමනාකරු විසින් නියම කරන ලද දිනයක වැඩ ආරම්භ කර, අදාල දිනයට වැඩය නිමකර දිය යුතුයි. එසේ නොකරන්නාවූ ටෙන්ඩර්කරුවන්ට ගිවිසුම් පත්‍රයෙහි සඳහන්වන අලාභය ගෙවීමටද සිදුවේ.

5. ටෙන්ඩර්කරුගේ අභිමතය පරිදි අවශ්‍ය නම් ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන විට පැමිණ සිටීමට ඔවුන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දින වශයෙන් ඉහතින් දක්වා ඇති දින එකී වේලාවට යාපනයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා. නි.) තැනගේ කායඹිලයේදී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ.

6. පිළිගත් පෝර්මයෙහි (දෙපිටපතකින් යුතුව) ඉදිරිපත් නොකරන ලද හෝ එහි සඳහන් කොන්දේසිවලට සම්පූර්ණයෙන්ම එකඟ නොවන්නාවූ කිසිම ටෙන්ඩර් පත්‍රයක් පිළිගනු නොලැබේ. ටෙන්ඩර් ගාස්තු ප්‍රමාණ හා මිළ ගණන් තීන්තෙන් පැහැදිලි ලෙස සටහන් කළ යුතු අතර, සියළුම වෙනස් කිරීම්වලට ටෙන්ඩර්කරුගේ අත්සන යොදා සහතික කළ යුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ නම් සහ ලිපිනයන් සම්පූර්ණ ලෙස පැහැදිලි අකුරින් සටහන්කර තිබිය යුතුය.

8. පිළිගත් ටෙන්ඩර්කරුට ගිවිසුමකට එළඹීමට සිදුවන අතරම ටෙන්ඩර් කරන ලදුව පිළිගනු ලැබුවාවූ වැඩ කොටස්වල මුලු වටිනාකමින් 5%ක මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැම්පත් කිරීමට සිදුවේ. මෙම මුදල ආපසු ගෙවනු ලබන්නේ කොන්ත්‍රාත්තුව සාර්ථක ලෙස ඉටු කළ පසුය. පිළිගත් ටෙන්ඩර්කරුට කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ තැම්පත් මුදල රාජසන්තක කර, රජය මගින් තබා ඇති වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයෙහි එම ටෙන්ඩර්කරුගේ නමද ඇතුළත් කරනවා ඇත.

9. ගිවිසුම් පත්‍රයට අදාලවන මුද්දර සඳහා තම අතින් වියදම් කිරීමට පිළිගත් ටෙන්ඩර්කරුට සිදුවේ.

10. අසතුටුදායක වැඩ කටයුතු නිසා හෝ කොන්ත්‍රාත්තුවේ සඳහන් නියමයන් ඉටු නොකිරීම නිසා හෝ කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේය. එවැනි අවස්ථාවක දී කොන්ත්‍රාත්කරුගේ වියදමින් එම වැඩ සම්පූර්ණකර ගැනීම සඳහා වෙනත් විධිවිධාන යොදා ගැනීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේය.

11. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ, ටෙන්ඩරයක හෝ ටෙන්ඩර්වල කොටසක් පමණක් පිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

